## වේළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය - 2015

වේළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ (ඩීඑස්ඩබ්ලිව්ආර්පීපී) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර එළඹී 2006 මාර්තු 16 දිනැති අංක කිව් 5200 දරන ණය ගිවිසුමේ 4.09 (ආ) ව්‍යවස්ථාව, 2006 අගෝස්තු 01 දිනැති අංක ටීඑෆ් 056901 දරන ප්‍රදාන ගිවිසුම සහ 2008 මැයි 28 දිනැති අංක සීර් 4406 දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වර්තමානයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය සහ පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ විශාල වේළි මෙහෙයුම් හා නඩත්තු කිරීම සඳහා දිගු කාලීන තිරසාර වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සහ ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීමයි. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,217.29 කට සමාන එජඩො මිලියන 72.21 ක් වන අතර ඉන් රු.මිලියන 7,494.07 කට සමාන එජඩො මිලියන 65.88 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජුනි 30 දින ආරම්භ කරන ලද අතර 2013 ජුනි 30 වනවිට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුවද 2011 ජූලි 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයට අනුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ එකඟත්වය සහිතව ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි

ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජුනි 30 දිනට ව්‍යාපෘති කාලපරිච්ඡේදය නිම වී තිබුණද, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 07 ක් සතුව පවතින ව්‍යාපෘතිය විසින් මිලදීගෙන තිබුණු පිරිවැය රු.මිලියන 1,139.69 ක් වූ දේපල, පිරියත හා උපකරණ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ව්‍යාපෘතියේ වත්කම් ලෙස දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී සංරචක 01 හා 02 යටතේ මිලදීගෙන තිබුණු රු.මිලියන 399.70 ක් වූ කාලගුණික උපකරණ, එළිවේටර්ස් හා බුල්ඩෝසර්වල පිරිවැය, මෙහෙයුම් පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය/ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 65.88 | 7,494.07 | 835.00 | 6.07 | 805.15 | 62.20 | 7,957.58 |
| ශ්‍රී ලං ර | 6.33 | 723.22 | 120.00 | 0.28 | 36.70 | 7.95 | 1,018.22 |
| | 72.21 | 8,217.29 | 955.00 | 6.35 | 841.85 | 70.15 | 8,975.80 |

**3.2 භෞතික ප්‍රගතිය**

**(අ) <u>සංරචකය 01 - වේළි ආරක්ෂණ හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම</u>.**
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 ජුනි දක්වා වර්ෂ 02 කින් ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කර තිබුණද, වේළි 32 කින් වේළි 27 ක පිළියම් වැඩ මාස 02 සිට මාස 29 දක්වා කාල ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. වැඩ නිම කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වේළි 11 ක පිළියම් වැඩ සඳහා පිරිවැය සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 335.05 ක් වැය කිරීමට සිදු වී තිබුණි. තවද වෙනත් වේළි 12 ක පිළියම් වැඩ වෙනුවෙන් එකතුව රු.මිලියන 228.41 ක පිරිවැය ඉතිරිකිරීම්ද වාර්තා වී තිබුණි.

(ii) රු.මිලියන 475.7 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද තිසා වැව, නච්චදූව වැව හා නුවර වැව ජලාශ වේළිවල පිළියම් වැඩ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2015 වර්ෂයේදී නවතා දමා තිබුණි. නවතා දමන අවස්ථාවේදී ඒ සඳහා රු.මිලියන 278.19 ක වියදමක් දරා තිබූ අතර ඉතිරි පිළියම් වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දී තිබූ අතර කොන්ත්‍රාත් 02 ක කාර්යසාධන බැඳුම්කර පමණක් ව්‍යාපෘතිය විසින් මුදල් කරගෙන තිබුණි.

(iii) මූල්‍ය ගිවිසුමේ 01 (ඕ) වගන්තියේ 01 උපලේඛනය ප්‍රකාරව, සේනානායක සමුද්‍රය, සමනළ වැව හා වික්ටෝරියා ජලාශ වේළිවල පැවතුණු ගැටලු නිරාකරණය කිරීම සඳහා විස්තරාත්මක විමර්ශන සිදුකර එමඟින් නිර්දේශ ලබා ගැනීමට රු.මිලියන 52.47 ක මුදලක් වෙන් කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානය දක්වාත් එම අධ්‍යයනයන් නිමකර නොතිබුණි.

(iv) රු.මිලියන 2,179 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සිදුකළ යුතු රන්දෙණිගල රන්ටැඹේ, රාජාංගනය, දඹුලු ඔය හා කන්ඩලම ජලාශවල ගේට්ටුවල තීන්ත ආලේප කිරීම හා නැවත ප්‍රතිස්ථාපනය කිරීම සහ දත්ත ලබාගැනීම හා නිරූපන පද්ධතිය (display system) සවිකිරීම, භූ චලන නියාමනය හා පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය සකස් කිරීම, වික්ටෝරියා වේල්ල හා පොල්ගොල්ල උමගෙහි පිළියම් වැඩ, ස්ලුයිස් බැරල් (Sluice Barrel) පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය හා ජල උපයෝජන සැලසුම් 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව - ශක්‍යතා අධ්‍යයනයන් පැවැත්වීම වැනි වැඩ ඇතුළත් කාර්යයන් 09 ක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානය දක්වා ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

ලබා දී තිබුණු තොරතුරු අනුව, වේළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යායනය සඳහා සැලසුම් යටතේ ඉහත සඳහන් වැඩ සිදු කිරීමට අපේක්ෂා කර තිබුණි.

(v) ලංකා විදුලි බල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන කාසල්රී ජලාශයේ වේල්ලේ සිවිල් වැඩ හා විදුලි වැඩ මාස 06 ක් තුළ සිදු කිරීම සඳහා රු.මිලියන 99.08 ක් වටිනා කොන්ත්‍රාත්තු 02 ක් ව්‍යාපෘතිය විසින් රාජ්‍ය සංස්ථාවකට ප්‍රදානය කර තිබුණි. එය 2013 වර්ෂයේදී නිම කිරීම සඳහා අපේක්ෂා කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වේල්ලේ පතුලේ ඇති උපාංගයකට අදාළ වැල්වයක් සවිකිරීම හැර අනෙකුත් කොන්ත්‍රාත් කටයුතු නිම කර තිබුණු අතර ඉතිරි වැඩ සඳහා ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යායන සැලැස්මක් යටතේ නව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට අපේක්ෂා කර තිබුණි.

(vi) මූල්‍යායන ගිවිසුමේ 01(ජී) වගන්තියේ 01 උපලේඛනය අනුව “මෙහෙයුම් හා නඩත්තු අත්පොත සංවර්ධනය කිරීම හා මෙහෙයුම් පරිපාටි පිළියෙල කිරීම” සහ වේළි 15 ක් සඳහා ක්ෂණික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම කළ යුතුව තිබුණද 2015 ජුනි 30 දිනට වේළි 08 ක් සඳහා පමණක් එම සැලසුම් පිළියෙල කර තිබුණි.

(vii) මූල්‍ය ගිවිසුමේ 01(ජේ) වගන්තිය අනුව, වේළි ආරක්ෂණ කාර්යයන් සඳහා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වුවද ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(viii) 2015 දෙසැම්බර් 31 දිනට පිළියම් වැඩ නිම කරන ලද වේළි පිළිබඳ වේළි පරාමිතීන්, නිම කළ වැඩවල ස්වභාවය හා පිළියම් වැඩ පිළිබඳ හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටලු පිළිබඳ සාරාංශ වාර්තාව 2016 මාර්තු 31 දිනට පෙර ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

**(ආ) <u>සංරචකය 2 - ජල කාලගුණික තොරතුරු පද්ධතිය නවීකරණය කිරීම</u>**

ජල කාලගුණික තොරතුරු පද්ධතිය නවීකරණය කිරීම සඳහා දත්ත රැස්කිරීමට මධ්‍යස්ථාන 122 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 628.94 ක වෙන් කිරීමක් කර තිබුණද, මධ්‍යස්ථාන 70 ක් පමණක් ස්ථාපිත කර තිබූ අතර 2015 ජුනි 30 දිනට ඒ සඳහා රු.මිලියන 813.57 ක මුදලක් වැය කර තිබුණි. තවද ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යායන සැලැස්ම සඳහා කරන ලද වෙන් කිරීම් යටතේ අනෙකුත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණි.

**(ඇ) <u>සංරචකය 3 - බහු ආංශික ජල සම්පත් සැලසුම්කරණය</u>**

බහු ආංශික ජල සම්පත් සැලසුම්කරණ වැඩසටහන යටතේ ජාතික ජල උපයෝජන සැලැස්ම, යාවත්කාලීන කරන ලද මහවැලි ජල සම්පත් සැලැස්ම සහ මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 742.75 ක වෙන් කර තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා රු.මිලියන 516.84 ක මුදලක් වැය කර තිබුණි. ඉන් රු.මිලියන 478.69 ක මුදලක්, සැලසුම් සකස් කිරීම සඳහා උපදේශක සේවා ලබාගැනීමට වැය කර තිබූ අතර ඒ සඳහා වෙන්කළ මුදල ඉක්මවා රු.මිලියන 49.21 ක් වැයකර තිබුණි. කෙසේ වුවද අදාළ සැලසුම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 ජුනි 30 වන විටත් ලබාගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී මෝටර් ග්‍රේඩර්ස් 05 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කැඳවන ලද ලංසු මත ව්‍යාපෘතිය විසින් දෙවන අඩුම ලංසුකරු තෝරා ගෙන තිබුණද, ප්‍රකාශන ලිපියේ (Letter of Expression) සඳහන් පරිදි, සැපයුම්කරු එවැනි උපකරණ සැපයීම සඳහා පළපුරුද්දක් ලබාගෙන නොතිබුණි. තවද එම උපකරණ තාක්ෂණික පිරිවිතරයන් කිහිපයකට අනුකූල වී නොතිබුණු බව නිරීක්ෂණය විය. අඩුම ලංසුකරු ඉදිරිපත් කරන ලද මිලට වඩා රු.මිලියන 5.87 ක මුදලක් තෝරා ගත් සැපයුම්කරුට ගෙවා තිබුණි.

(ආ) නාලන්දා ජලාශයේ වේල්ල අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 267.90 ක් වුවද 2013 වර්ෂයේදී රු.මිලියන 392.99 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් සඳහා මාස 24 කට පහසුකම් සැපයීමට ප්‍රමාණ පත්‍රයෙහි රු.මිලියන 2.40 ක මුදලක් පමණක් වෙන් කර තිබූ නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ලංසුවේ ඒ සඳහා රු.මිලියන 60 ක මුදලක් ඇතුළත් කර තිබූ බවත් නිරීක්ෂණය විය. විචලන නියෝගයන් 49 ක් මඟින් කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු.මිලියන 392.94 සිට රු.මිලියන 611.30 දක්වා සියයට 55 කින් පසුව වැඩි කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. ලබා ගත හැකි වූ තොරතුරු අනුව, වැඩවල මුළු පිරිවැයෙන් රු.මිලියන 407.05 ක මුදලක් පමණක් මෙම ව්‍යාපෘතියෙන් වැයකර තිබූ අතර ඉතිරි රු.මිලියන 204.25 ක මුදල ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යයන සැලැස්ම යටතේ වැයකිරීමට අපේක්ෂා කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, වේළි 15 ක පිළියම් වැඩ සම්පූර්ණ කර තිබූ අතර 2015 ජූනි 30 දිනට අවසාන ගෙවීම් නිරවුල් කර තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එම වැඩවල අවසාන ගෙවීම් හා රඳවා ගැනීම් මුදල් මුදා හැර නොතිබුණි.

(ආ) මූල්‍ය ගිවිසුමේ 01 (එක්) ඡේදය අනුව, පොල්ගොල්ල හා නව ලක්ෂපාන ජලාශවල උමඟයන්හි අවශ්‍ය පිළියම් වැඩ හඳුනා ගැනීම සඳහා පර්යේෂණයක් සිදු කළ යුතුව තිබුණි. පිළිගත් ඉංජිනේරු පරිචයන් අනුව, උමඟ ඉදිකිරීමෙන් වර්ෂ 20 – 30 අතර කාලය තුළ එවැනි පර්යේෂණන් සිදු කළ තිබුණු නමුත් 2015 දෙසැම්බර් 31 දින වර්ෂ 28 ක් ඉකුත්වී තිබුණද පොල්ගොල්ල උමඟ පිළිබඳ අවශ්‍ය පර්යේෂණ සිදුකර නොතිබුණි. සමාලෝචන රැස්වීම්වලදී කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව, පර්යේෂණ කාර්යයන් සඳහා වේල්ල වසා දැමීම හේතු කොටගෙන සාමාන්‍ය මහජනතාවට සිදුවන අසීරුතාවය හේතුවෙන් මෙම කාර්යය නොසලකා හැරීමට රේඛීය අමාත්‍යාංශය උපදෙස් නිකුත් කර තිබුණි. කෙසේ වුවද පර්යේෂණ සඳහා විධිමත් සැලැස්මක් නොමැති බව හා උමඟට හානි සිදුවීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකි බව නිරීක්ෂණය විය.